# Gampaha Wickramarachchi University of Indigenous Medicine, Sri Lanka
## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## පුරප්පාඩු

### විවෘත අයදුම්පත් කැඳවීම - 2026

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්පත් යොමු කිරීම සඳහා උපදෙස්**

1. අයදුම්පත් **මාර්ගගත ක්‍රමවේදය (online application portal) ඔස්සේ පමණක්** ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය **gwu.ac.lk** වෙබ් අඩවියේ **vacancies** යටතේ ඉදිරිපත් කර ඇත. **මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඪ පිටපතක්,** බාගත කර **(Download)** **අයදුම්කරු විසින් අත්සන් කර 2026.04.27** වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **සහකාර ලේඛකාධිකාරි, ආයතන අනධ්‍යයන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය .

2. වෙබ් අඩවියේ දක්වා ඇති **online application portal** වෙත පිවිසීමට ප්‍රථම, වෙබ් අඩවියේ පළකර ඇති දැන්වීම මගින් ඉල්ලා ඇති සියලු ලේඛනවල මෘදු පිටපත් කලින් සූදානම් කර ගත යුතු අතර, **GWUIM RMS User Guide** මගින් දක්වා ඇති උපදෙස් පිළිවලින් අනුගමනය කොට ඔබගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

3. අයදුම්කරුවන් විසින් නැවත නොගෙවනු ලබන රු **.750/-** ක අයදුම්පත් හා විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. එය ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය නමින් මහජන බැංකුව, යක්කල ශාඛාවේ **333-1001-1- 0000059** ගිණුම් අංකයට බැර කොට, අදාල රිසිට්පතෙහි මෘදු පිටපත මාර්ගගත ක්‍රමවේදයේ දක්වා ඇති පරිදි **PDF** ලෙස උඩුගත **(upload)** කළ යුතු වේ. එහි මුල් පිටපත අයදුම්පත සමඟ එවීම අනිවාර්ය වේ.

4. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා වූ පද්ධතිය (**online application portal** ) **2026.04.10** **දින සිට** **2026.04.24** දින දක්වා විවෘතව පවතිනු ඇත. තාක්ෂණික ගැටළු හෝ විමසීම් වේ නම් 033 2215829 හෝ 033 2222740 දුරකථන අංකවලට **රාජකාරි දිනවල පෙ.ව 8.30 – ප.ව. 4.00 ත්** අතර ඇමතිය හැකිය .

5. **අයදුම්පත්‍රය බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර පැහැදිලිව සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ .**

6. අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම , අපැහැදිලි වීම, සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොතිබීම, මුදල් ගෙවූ ලදුපත අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ . කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

1. <u>ඖෂධවේදී (පහළ ශ්‍රේණිය)</u>

**අවශ්‍ය සුදුසුකම් :** සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් (Sri Lanka Medical Council) පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය : U-MT 1 (III) - රු.51,095-7X540;10X640-60,575 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මඟින්**

**වයස** :අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය

2. <u>තාක්ෂණික නිලධාරි II ශ්‍රේණිය "ආ" ඛණ්ඩය (Seg. B)</u>

**අවශ්‍ය සුදුසුකම් :** (i) අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී විද්‍යා විෂයයන් 03 කින් සමත්ව තිබීම.
විෂය සංයෝජනය (Subject Combination) අධ්‍යනාංශයේ නිර්දේශය මත අදාළ පීඨය විසින් තීරණය කරනු ලැබේ.

සහ

(ii) තනතුරට අදාළ අවම වශයෙන් වසරක පූර්ණකාලීන වෘත්තීය පුහුණු පාඨමාලාවක් සමත්ව තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම. මෙම තනතුරට සඳහා පුහුණු පාඨමාලාව හෝ ඒ හා සමාන සුදුසුකම අදාළ පීඨයේ පිළිගැනීම මත තීරණය වේ.

**සටහන:-** බඳවාගනු ලබන තැනැත්තන් ප්‍රථමයෙන් අවුරුදු (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව "පුහුණුවන තාක්ෂණික නිලධාරී" වශයෙන් පත් කරනු ලැබේ. පුහුණුවීමේ කාලය අවසන් වීමෙන් පසු විද්‍යාගාර කටයුතු පිළිබඳ නිපුණත්වය, භාණ්ඩ ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත් සේවක හවතුන් තනතුරෙහි තහවුරු කර II ශ්‍රේණිය "ආ" ඛණ්ඩයේ තාක්ෂණික නිලධාරි තනතුරට පත් කරනු ලැබේ.

**වැටුප් පරිමාණය : UMT 1 (III) - රු.51,095-7X540;10X640-60,575 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස** :අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය

## 3. තාක්ෂණික නිලධාරි II ශ්‍රේණිය "අ" ඛණ්ඩය (Seg. A)

**අවශ්‍ය සුදුසුකම් :**

i. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය (NDT) හෝ ඒ සමාන සුදුසුකම් ලබා තිබීම.

හෝ

ii. ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

හෝ

iii. අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ වන ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

හෝ

iv. අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළව වසර දෙකක පූර්ණකාලීන ඩිප්ලෝමාව සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :UMT 1 (II) - රු.57,435-7X640;9X890-69,925 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම** : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස** :අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය

## 4. ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සමත් වීම සහ සිංහල භාෂාව / දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය යන විෂයන් ඇතුලුව සම්මාන සාමාර්ථ 05 ක් තිබිය යුතුවේ.
2. පොලිස් හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල පද්ධතියේ ආරක්ෂක සේවයේ හෝ පිළිගත් ආරක්ෂක සේවයක අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
3. ක්‍රීඩා කටයුතුවල ක්‍රියාකාරීව සහභාගී වී තිබිය යුතුය.
4. උස - අඩි 5 අඟල් 4 නොඅඩු විය යුතුය.
5. පපුව - අඟල් 34 ට නොඅඩු විය යුතුය.
6. අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය : UMN 1 (III) - රු. 49,475 – 17x540 – 58,655 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

බී.ඒ.එන්.ක්‍රිෂාන්ත
ලේඛකාධිකාරි
2026.04.10